රඟ මඬල

කලාභූෂණ ගන්ධර්වතිලක, සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාද්‍ය ශිල්පී.

ලයනල් ගුණතිලක ලියයි

ශ්‍රී ලංකාවේ ටවර් හෝල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව

ශ්‍රී ලංකාවේ ටවර්හෝල් යුගය, එනම් ක්‍රි.ව. 1911 සිට දශක ගණනාවක් සිංහල නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍ය කතුවරුන් සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාවක දෙවැන්න.

2016 ජූනි කලාපයෙන් විමර්ශනයක යෙදුන ඩී.ඇල්. බෝධිපාල සූරින් නූර්ති නාට්‍යකලා ක්ෂේත්‍රයට සිදුකරන ලද අනුපමේය සේවයට අතිරේකව ඉමහෝන් තැටි මගින් සිදුකරන ලද ජාතික මෙහෙය අති විශාලය. එතුමන් විසින් රචිත මෙම ගීතයෙන්ගෙන් ගීත දෙකක් පමණක් මෙහිදී ප්‍රස්ථාර සහිතව ඉදිරිපත් කෙරේ.

මෙම ගීතයන් රසවිඳීමට නම් සම්භාව්‍ය සංගීතය පිළිබඳ මහා රසඥතාවක් තිබිය යුතුමය. එවැනි රසවතුන්ට මෙම ගීතයන්ගේ ස්වර සංකලනයන් තුළින් පමණක් නොව සංස් කෘත මිශ්‍ර සිංහල භාෂාව සංයෝජනය වීමෙන් කර තිබෙන අමිල මෙහෙය තව තවත් තීව්‍ර වනු නොඅනු මානය. තවත් විධියකින් හඳුන්වනවානම් ස්වර මාධූර්යය අමෘතයක් වනු ඇත.

ශ්‍රී ලාංකික ජාතියට තිරසාර ජාතික ගීතයක් නොතිබුණු යුගයක මෙතුමන් විසින් ජාතිකාභිමානය දනවන මෙම ගීතය රචනා කර එකල ප්‍රසිද්ධ ගායකයෙකු මෙන්ම ජනප්‍රිය නළුවෙකු වූ ඇන්. රොමියුලස් ද සිල්වා මහතා ලවා ගායනා කර ජාතියට තිලිණ කර ඇත. රොමියුලස් ද සිල්වා මහතා ශාස්ත්‍රීය සංගීතය හැදෑරූ අයෙකු නොවේ. එහෙත් එතුමාට අගනා ගායන කුසලතාවයක් තිබීම නිසා එම ගීතය එකල ජනප්‍රිය වී තිබේ. එම ගීතයේ ඇති හරවත් බවත් රසවත් බවත් ප්‍රතිනිර්මාණය කිරීම වස් මෙසේ සඳහන් කරනුයේ අති මහත් ප්‍රීතනයෙනි.

ශ්‍රී ලංකා මාතාවගේ අභිමානය

මුතු ඇටයකි ඉන්දීය සාගරයේ මේ මනෝරම්‍ය ලංකා, මනෝරම්‍ය ලංකා ....., මනෝරම්‍ය ලංකා,
පුණ්‍ය භූමිය මහි මණ්ඩලයේ ආදී රාම රාජා ජයගත්
ජානකි දේවී වාසෙ කළා ඒ අශෝක නම් වනයේ
මුතු ඇටයකි .....
සිව් සැට කලාද දශ අට භාෂා දන්නෝ පුරාතනේ
උන්නෝ මේ දීපේ භගවත් ශුද්ධ රහතුන් හා
මේ මනෝරම්‍ය ලංකා
ප්‍රවේණි භූමිය මහි මණ්ඩලයේ විවක්ෂණ වූ පෙ-
රනේ
දැන් අල්ලාදිපි සමහර ලොක්කෝ ජාති බැම්ම ලෙහිලා
මනෝරම්‍ය ලංකා.../ / /

'සිව්සැට කලාද' යන කොටසත් 'ප්‍රවේණි භූමිය' යන කොටසත් අන්තරා ස්වර අනුව ගැයේ. වැයේ. මෙම ගීතයේ ප්‍රස්තාරය මධ්‍යම ස්වරය 'ස' ලෙස යොදා ගැනීමෙන් මෙහි ස්වර මාධූර්ය තව තවත් තීව්‍ර වනු ඇත. එය ගුරු ඇසුරුකින්ම ලබාගත යුතුය.

එසේම සංස්කෘත මිශ්‍ර සිංහල භාෂාවෙන් රචනය කර ඇති මෙම ගීතයේ ගැලපීම් කොතරම් සාරවත්ව තිබේදැයි යන්න විමසා බැලීම උගත් බුද්ධිමතුන්ට බාරය.
එතුමන්ගේ තවත් ගීතයක් තුළින් ද සමාජයට දෙන පණිවුඩය බලන්න.

ගීතය

දියුණුවේ රඟ පෙනේ පෑදීමේ කාලේ අපේ සිංහල ජාතියේ
වැරදි කරත් මැයි ජාති විනාසේ බොහෝ සේ සිටිත් මැයි
පසගෙන වංශේ
අගමුල කිමද නොතේරී මුලා වී ආදී සිංහල ජාතියේ
දුරැරා ප්‍රදේශේ ආදරේ ප්‍රකාශේ - සිරිත් විදේශේ ආලෙපා
විශේෂේ
සිරිත් විදේශේ ආලෙපා විශේෂේ
කොඳුරති වැරදි මුලාවේ වී අපේ සිංහල ජාතියේ

මෙම ගීතය ගැමඟෝන් තැටියට ගයා ඇත්තේ ප්‍රවීණ සංගීතඥ එච්.ඩබ්. රූපසිංහ මාස්ටර් විසිනි.
ගීතයේ ප්‍රස්තාරය, රාගය බිහාග් රාගයේ ඡායාව ඇත. තාලය කෙහෙර්වා 4/4

ප්‍රස්තාරය

'අගමුල' යන කොටස ස්ථායී කොටස ලෙසත් 'දුරැරා ප්‍රදේශයේ' යන කොටස අන්තරා කොටස ලෙසත් 'කොඳුරති වැරදි මුලාවී අපි' යන කොටස ස්ථායී කොටස අනුවත් ගත යුතුයි.

මෙහි සඳහන් ගීත පමණක් නොව ඕනෑම පැරණි නූර්ති, නාඩගම් හා ගැමඟෝන් යුගවල ගීත ඉගෙනීමට අවශ්‍ය අයට ලයනල් ගුණතිලකයන්ගේ දුරකථනය ඔස්සේ ඉගැන්විය හැකි බැවි හෙතෙම පවසයි. ඔහුගෙන් ඉගෙනගන්නා ශිෂ්‍යයෝ ඔස්ට්‍රේලියාවේ විවිධ ප්‍රදේශ වල සිටින බවත් වැඩිදුරටත් සඳහන් කරයි.

ඔහුගේ දුරකථන අංකය 011 2 833 814
ජංගම 071 8293227

ඊලඟ කලාපයෙන් තවත් පැරණි රසවතෙක් හඳුනාගනිමු.

FOR ALL YOUR TRANSLATIONS
PROFESSIONAL TRANSLATOR
NAATI accredited (Level 3)

(ENGLISH SINHALESE)
Documents for immigration purposes

- BIRTH , MARRIAGE, DEATH
- EDUCATIONAL/ VOCATIONAL
- LEGAL and POLICE DOCUMENTS
- NATIONAL IDENTITY CARDS

CONTACT
DR. PREMA KUDALIGAMA
(BA, PGDE, M.A. Ph.D (Edu.)
NAATI Level 3 (Interpreting & Translating)

Tel:(03) 94671658 mob: 0458 60 60 66
Email: premaku@bigpond.com